# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
📠 011 286 4051

මගේ අංකය / எனது இல / My No. L2/1/09/චක්‍රලේඛ/2019 ඔබේ අංකය / உமது இல / Your No දිනය / திகதி / Date 2019.12. 24.

චක්‍රලේඛ අංක - 2019/03

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

ඉඩම් කොමසාරිස්වරු/නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,

සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,

අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය වෙත.

<u>ප්‍රාදේශීය කාර්මික ජනපද සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීම.</u>

ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනයට ප්‍රතිලාභ සලසමින් ක්‍රියාත්මක වන කාර්මික ජනපද හා කර්මාන්තපුරවල ආයෝජනයන් සිදුකරන ආයෝජකයන් සඳහා රජයේ ඉඩම් බදු ලබාදීමේදී යම් යම් සහන ලබාදීමේ අරමුණින් කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය හා ඉඩම් හා පර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ යන අමාත්‍යාංශවලින් ඉදිරිපත්කරන ලද උක්ත කරුණට අදාළ අංක 2019/96 හා 2019.10.14 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019.11.12 දින ලබාදී ඇත.

02. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා මහවැලි සංවර්ධන අධිකාරිය යන ආයතනවල එකගතාවය සහිතව ඒකාබද්ධ චක්‍රලේඛයක් ලෙස මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

03. ඒ අනුව මෙම විෂය සම්බන්ධව මින් පෙර නිකුත් කරන ලද කර්මාන්තපුර හා කාර්මික ජනපදවල ආයෝජනය කරනු ලබන කර්මාන්තකරුවන්ට සහන සැලසීම මැයෙන් 2013.12.03 දිනැතිව මා විසින් නිකුත් කරන ලද 2013/08 දරන චක්‍රලේඛය හා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් 2018.05.25 දිනැතිව කර්මාන්තපුරවල පිහිටි ඉඩම්වලින් බදු අය කිරීම මැයෙන් නිකුත් කරන ලද 2018/01 දරන චක්‍රලේඛය මෙයින් අවලංගු කර උක්ත අනුමැතිය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරමි. ඒ අනුව මෙම අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ 2019.11.12 දින සිට ඉදිරියට වලංගු වන පරිදි මෙම චක්‍රලේඛයේ උපදෙස් ක්‍රියාත්මක කල යුතුය.

3.1.1. ප්‍රාදේශීය කාර්මික සංවර්ධන වැඩසටහන ශක්තිමත් කිරීම යටතේ ඉඩම් බදු ලබා දී ඇති අවස්ථාවන්වල දී බදු කාලය ආරම්භ වන දිනයේ සිට 2011.06.01 වන දින දක්වා අයවිය යුතු හිඟ බදු මුදල් හා දඩ මුදල් සම්පූර්ණ වශයෙන් කපා හැරිය යුතු වන අතර එදින සිට බදු මුදල් නිසිලෙස අයකිරීම සිදුකළ යුතුය.

3.1.2. 2011.06.01 දින දක්වා නිසි පරිදි අඛණ්ඩව බදු ගෙවූ හෝ යම් බදු මුදලක් ගෙවූ අයෙකු වේ නම් ඒ අය විසින් ගෙවන ලද බදු මුදල් 2011.06.01 දින සිට ඉදිරි වර්ෂ සඳහා ගෙවිය යුතු බදු මුදල් වෙනුවෙන් හිලව් කර ගත යුතුය

3.1.3. එසේ බදු මුදල් කපා හැරෙන කර්මාන්තකරුවන් අතර 2011.06.01 දිනය වන විට වසර 05ක් සම්පූර්ණ නොවන කර්මාන්තකරුවන් වේ නම් ඒ අය සඳහා බදු ගිවිසුම් ගත වන දින සිට ඉදිරියට උපරිම අවුරුදු 05ක කාලයක බදු මුදල් දඩ මුදල් කපා හැරිය යුතුය. එහිදී එම කාලය වෙනුවෙන් ගෙවූ යම් මුදලක් තිබේ නම් එම මුදල්, බදු ගෙවිය යුතු ඉදිරි කාලය වෙනුවෙන් හිලව් කල යුතුය.

3.1.4. මෙම සහන ලබාදෙන්නේ කාලසීමාවකින් තොරව එක් ඉඩම් කොටසක් සඳහා එක් වරක් පමණක් යන පදනමින් වන අතර, අදාළ ඉඩම් කොටස පරිහරණය කරනු ලබන ආයෝජකයන් පදනමින් නොවේ.

3.1.5 ඒ අනුව කිසියම් ඉඩම් කොටසක් සම්බන්ධයෙන් කිසියම් ආයෝජකයෙකු වෙත ඉහත සහනයන් එක්වරක් ලබා ගෙන තිබේ නම්, අදාළ ඉඩම් කොටස වෙනත් ආයෝජකයෙකු වෙත නැවත ලබා දෙන අවස්ථාවක දී, නව ආයෝජකයා වෙත එම ඉඩම් කොටස සම්බන්ධයෙන් ඉහත බදු සහනයන් හිමි නොවේ.

3.2. කර්මාන්තකරුවෙකු වෙත ඉඩම ලබා දුන් දිනය ලෙස සැලකිය යුත්තේ කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අදාළ ඉඩම් කොටස කර්මාන්තකරු වෙත විධිමත්ව භුක්තිය භාරදීමට ඉඩම් වෙන් කිරීමේ ලිපිය නිකුත් කරනු ලබන දිනය වේ. එම දිනය බදු කාල සීමාව ආරම්භ වන දිනය ලෙස සලකනු ලැබේ.

3.3. 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පණත යටතේ බදු පදනම මත බැහැර කර ඇති වාණිජ ඉඩම් සඳහා සහන ලබා දීම යන මැයෙන් අංක 2017/1 යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය, කාලීන බදු පදනම මත ලබා දී ඇති ඉඩම්වලට අදාළ සියළුම කර්මාන්තකරුවන් සඳහා අදාළ කර ගත යුතුය.

3.4. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පිහිටුවා ඇති කර්මාන්තපුරවලට හැර අනෙකුත් සියළුම කර්මාන්තපුරවල 2011.06.01 දිනට පසුව අළුතෙන් ආරම්භ කරනු ලැබූ සහ ඉදිරියේ දී ආරම්භ කරනු ලබන කර්මාන්ත සඳහා කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශය විසින් ඉඩම්වල භුක්තිය භාරදෙන දින සිට වසර 05ක බදු සහන කාලයක් හිමිවන අතර මෙම සහනය ද එක් ඉඩම් කොටසකට එක්වරක් පමණක් යන පදනමින් ලබාදිය යුතුය.

3.5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පිහිටුවා ඇති කර්මාන්තපුර සඳහා 1972 අංක 1 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව, කර්මාන්තකරුවන්ගේ ආයෝජන දිරි ගැන්වීමක් ලෙස, බදු ගිවිසුමෙහි බදු මුදල් ලෙස අයකරනු ලබන මුදල, ඉඩමේ තක්සේරුවෙන් අයකල යුතු මුදලෙන්, 10%ක නාමික වටිනාකමක් ලෙස මුල් වසර 05ක කාලය සඳහා වර්ෂිකව අය කළ යුතුය.

04. කාර්මික ජනපද හා කර්මාන්තපුරවල ආයෝජකයින් වෙත බදු ගිවිසුම ප්‍රමාදයකින් තොරව ලබාදීම හා නිසිපරිදි බදු මුදල් අයකර ගැනිම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනිමට නිරන්තරයෙන් ක්‍රියා කළ යුතුය.

05. මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් වෙතොත් මා විමසන ලෙස ද කාරුණිකව දන්වමි.

(අත්සන)

ආර්.එම්.සී.එම්.හේරත්

ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත් - 1. ලේකම්, ඉඩම හා ඉඩම සංවර්ධන අමාත්‍යාංශය

2. ලේකම්, මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

3. ලේකම්, කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය

4. ලේකම්, මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව